# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්

## අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

### 2027 ජනවාරි මස 01 දින සිට 2027 දෙසැම්බර් මස 31 දින දක්වා

### ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම

**2027 ජනවාරි මස 01** දින සිට **2027 දෙසැම්බර් මස 31** වන දින දක්වා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන **(1)** තලවකැලේ පරිශ්‍රය හා ශාන්ත කුම්බිස් වතුයාය, **(2)** රත්නපුර, **(3)** හන්තාන, **(4)** දෙනියාය, **(5)** වලහන්දුව යන මධ්‍යස්ථානයන් සඳහා ආරක්ෂක සේවාවන් සැපයීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි පිළිගත් ආරක්ෂක ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසු, වෙන් වෙන් වශයෙන් කැඳවනු ලැබේ.

එක් ලංසුවක් සඳහා **රුපියල් 3,500/-** ක් (රුපියල් තුන් දහස් පන්සියයක්) බැගින් ඉහත මධ්‍යස්ථානයන් සඳහා වෙන් වෙන් වශයෙන් වන සේ ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් තලවකැලේ ලංකා *බැංකුවේ* අංක 03630616 දරන ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ජංගම ගිණුමට බැර කිරීමෙන් අනතුරුව, එම මුදල් බැර කිරීම් සටහන් හා අභිමතය ප්‍රකාශ කිරීම ඉදිරිපත් කිරීමෙන්, ලංසු විස්තර අඩංගු ලිපි ලේඛණ, **2026 ඔක්තෝබර් මස 19 දින සිට 2026 නොවැම්බර් මස 09 වන දින ප.ව. 3.00** දක්වා තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රසම්පාදන ඒකකයට පැමිණ ලබා ගත හැකිය.

ලංසුපත් බහාලන කවරයේ වම් කෙලවරේ උඩ කොටසේ **“ආරක්ෂක සේවාව සඳහා වූ ලංසු: 2027 - තලවකැලේ/රත්නපුර/හන්තාන/දෙනියාය/වලහන්දුව”** යනුවෙන් සඳහන් කර මුද්‍රා තබන ලද ලංසුපත් සභාපති, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව **(ප්‍රධාන)** වෙත ලැබීමට සැලැස්විය යුතුය. තනි තනි ලංසු ලේඛණ තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාලයේ පරිපාලන අංශයෙහි තබා ඇති පෙට්ටියට බහාලීම **2026 නොවැම්බර් මස 10** දින **ප.ව 2.00** ට හෝ ඊට පෙර කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රසම්පාදන ඒකකය 052 2258201 (Ext 205) ඔස්සේ ඇමතීමට හැකිය.

ලංසුපත් ලබා ගන්නා ලද ලංසු කරුවන් සඳහා **2026 නොවැම්බර් මස 03** දින **පෙරවරු 10.00** ට මාර්ගගත තාක්ෂණය ඔස්සේ ලංසු පෙර රැස්වීමක් **(Pre Bid meeting)** පැවැත්වේ. **2026 නොවැම්බර් මස 10** දින **ප.ව 2.00** ට ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ හෝ මාර්ගගත ලෙස සහභාගි විය හැකිය. ලැබෙන ලංසු සියල්ල හෝ ඉන් කොටසක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන) සතුය.

**සභාපති**

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**

**තලවකැලේ**